UNIVERSITY OF ALBERTA
FACULTY OF EXTENSION

UNIVERSITY of GUELPH
CHANGING LIVES
IMPROVING LIFE

FRONTLINESMS

SAHANA
SOFTWARE FOUNDATION

# සමූහ අධ්‍යන කෘෂිකාර්මික ප්‍රජා අතර තොරතුරු සන්නිවේදන තාක්ෂණය ප්‍රතිග්‍රහණය සහ භාවිතය සඳහා තාක්ෂණික කළමනාකාරිත්වය යොදා ගැනීම: හඳුන්වාදීමකි

උතුර අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අවස්ථා අධ්‍යයනයක්

Social Sciences and Humanities Research Council of Canada
Conseil de recherches en sciences humaines du Canada
Canada

# තාක්ෂණික යෙදුම් හඳුන්වා දීම

## තාක්ෂණික කළමනාකාරිත්වය

තාක්ෂණික කළමනාකාරිත්වය ඕනෑම වෘත්තිකයෙකුට භාරගතහැකි නායකත්ව භූමිකාවකි. මෙම භූමිකාව තුල තාක්ෂණික කළමනාකාරිත්වය යනුවෙන් අදහස් කරනුයේ ප්‍රජාවක් සමඟ කටයුතු කරන කිසියම් පුද්ගලයෙක් විසින් ඔවුන් තාක්ෂණය පිළිගැනීමට දිරිමත් කිරීමත්, සන්නිවේදනයට, පුහුණුවීමට සහ තොරතුරු හුවමරුව සඳහා ඩිජිටල් තාක්ෂණය භාවිතා කිරීමත්ය.

තම ප්‍රජාවේ සාමාජිකයන් හට අවස්ථා හා අභියෝග හඳුනාගැනීමට තාක්ෂණික කළමනාකාරිත්වය සම්බන්ධ විය හැකි ආකාරය දැනගැනීමේ අවශ්‍යතාවය; ඔවුන්ගේ අවශ්‍යතාවය අනුව සුදුසු ඩිජිටල් තොරතුරු සන්නිවේදන හා තාක්ෂණය උපයෝගී කරගැනීම මගින් නව්‍යකරණයේ පුහුණුවීම් අත්පත්කරගැනීමට මෙන්ම ඒවාට හැඩගැසීමටත්; ඔවුන්ගේ උත්සහායෙන් ලැබෙන ප්‍රතිඵල ප්‍රජාවට මෙන්ම අනුග්‍රාහකයන්ට ඇහයීමට මෙන්ම වාර්ථාකිරීමටත් අවශ්‍ය වේ. ඒ අනුව වෘත්තිකයන් සඳහා මූලික කුසලතාවන් මෙන්ම අඩු වියදම් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ප්‍රජාවේ පුහුණුවීම් සඳහා යොදාගැනීමේ ගවේෂණාත්මක ප්‍රයත්නයට දායකවන අත්‍යාවශ්‍ය විධි හඳුනාගැනීමට හැකිවනසේ මෙම පාඨමාලාව සැලසුම් කර ඇත.

තාක්ෂණික කළමනාකාරිත්වයට අදාල වැඩසටහනක් දියත්කිරීමේ මධ්‍ය පරිමාණ අරමුණ වනුයේ එමගින් ඩිජිටල් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ප්‍රචලිත කිරීමත්, ප්‍රජාව තුල පුහුණුවීම් වල නව්‍යකරණය වැඩිකිරීමටත්ය. ප්‍රජාවේ සාමාජිකයන් තුල නව්‍යකරණ සිතීමකට ඉලක්කවන පරිදී තාක්ෂණික කළමනාකාරිත්වය නිර්මාණය කළයුතු අතර එහි දිගුකාලීන අරමුණක් වනුයේ වෘත්තිකයන් සඳහා ඩිජිටල් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය මඟින් තොරතුරු හුවමාරුවට මෙන්ම දැනුම එක්රැස් කිරීමට පුළුල් පරාසයක ඇති තෝරාගැනීම් අධිකකිරීමය.

## ජීවනෝපාය සඳහා සන්නිවේදනය

ජීවනෝපාය සඳහා සන්නිවේදනය යනුවෙන් අදහස් වන්නේ මිනිසුන් අතර ජීවනෝපායට අයත් කාර්යයන් කිරීමට අදාල ක්‍රියාකාරකම් හා ඉල්ලීම් ආශ්‍රිත විවිධ ආකාරයේ අන්තර්ක්‍රියාවන්ය. ඒ සඳහා උදාහරණ ලෙස රැස්වීම් සංවිධාන කටයුතු, නව ක්‍රම විධි හෝ තාක්ෂණය හුවමාරු කරගැනීම හෝ වෙළඳපොළ හෝ රජය විසින් සිදුකරන වෙනස්වීම් හෝ පාලක අවශ්‍යතාවන්ට අදාල ඉතා වැදගත් තොරතුරු හුවමාරු කිරීම දැක්විය හැක.මෙම අන්තර්ක්‍රියා තුල සාමාන්‍ය පෞද්ගලික හුවමාරුවීම්ද අන්තර්ගතවන නමුත්, ජීවනෝපාය සඳහා සන්නිවේදනයේ ප්‍රමුඛතම අරමුණවන්නේ ජීවනෝපාය ආශ්‍රිත කාර්යයන්ට අදාල තීරණගැනීමට මෙන්ම ඉගෙනීමට රුකුලක්වන පරිදී තොරතුරු සහ දැනුම හුවමාරු කිරීමය.

තාක්ෂණික කළමනාකරණය තම ප්‍රජාවේ සාමාජිකයන්ට ජීවනෝපාය සඳහා සන්නිවේදනය සහ එහි වෙනස්වීම්වලට අදාලව ප්‍රමුඛතම අවශ්‍යතා සහ සම්බන්ධතා හඳුනාගැනීමට දායක වේ. ඒමඟින් ඔවුන් ප්‍රයෝගික හා සපයාගතහැකි තාක්ෂණය තුළින් මෙම අභියෝග ජයගැනීම උදෙසා ක්‍රියා මාලාවක් තෝරාගැනීම සහ හඳුන්වාදීම සිදුකරයි.මෙම ක්‍රියා මාලාව සීමාසහිත කාලසීමාවක් තුල, සුළු පරිමාණ සොයාගැනීම් මඟින් ප්‍රජාවේ ප්‍රමුඛතාවය සම්බන්ධයෙන් අදහස් කරන්නාවූ විශේෂිත අරමුණු

මුදුන්පමුණුවා ගැනීම සඳහා ආරම්භ කරයි. කාලයත් සමඟ මෙම ක්‍රියා මාලාව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සන්නිවේදන වැඩසටහන් දක්වා ක්‍රමයෙන් විකාසය කිරීමට හැකියාව පවතින අතර, නමුත් එය පමණක්ම මෙම ක්‍රියා සමූහයේ සාර්ථකත්වය මැනීමේ මිනුමක් කරගත නොහැක.

තාක්ෂණික භාරකරු වඩාත් සාර්ථක වන්නේ ඔහු හෝ ඇය ජීවනෝපාය සඳහා සන්නිවේදනයට අදාල අභියෝගතාවලට ප්‍රතිචාර දැක්වීමේදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදාගැනීමේ හැකියාව පිළිබඳ දැනුවත්භාවය වැඩිකරගැනීම මගින් සහ ප්‍රජා සාමාජිකයන් අතර තෝරාගැනීමේ පරාසය පුළුල් කරගැනීම මඟිනි.

## සමූහ අධ්‍යන ප්‍රජාවන්

ජීවනෝපාය සඳහා සන්නිවේදනයේ ඉතා වැදගත් අංගයක්වන්නේ පුහුණුවීම් දියුණුකරගැනීමටත්, ප්‍රතිඵල දියුණුකරගැනීමට සහ ඒමඟින් හැකි සෑම අවස්ථාවකදීම සම්පූර්ණයෙන්ම දියුණුව සඳහා දායකත්වය සැපයීමත්, එනම් ජීවනෝපාය නොනැසී පවත්වාගැනීමට සහ දියුණුකරගැනීමට දායකත්වය සපයන තොරතුරු හුවමාරුවයි. අප මෙවනි වර්ගයේ තොරතුරු හුවමාරුකිරීමේදී, අප ඉගෙනගැනීමේ අත්දැකීමකටද සහභාගී වන අතර, එනම් ඉගෙනගැනීමේ අරමුණ සඳහා තොරතුරු හුවමාරුකිරීමේ අවශ්‍යතාවය ජීවනෝපාය සඳහා සන්නිවේදනයට ඉතා වැදගත් අභිප්‍රේරණයකි.

ඒ අනුව කණ්ඩායමක් එක්ව ඉගෙනගැනීමේ අරමුණින් යුතුව තොරතුරු හුවමාරු කරගැනීම සමූහ අධ්‍යන ප්‍රජා ලෙස හැඳින්වේ:

> මිනිසුන් කණ්ඩායම් විසින් කිසියම් කාර්යයක් සම්බන්ධයෙන්, ප්‍රශ්න මාලාවක් සම්බන්ධයෙන්, හෝ කිසියම් ලැදියාවක් ඇති මාතෘකාවක් සම්බන්ධයෙන් සහ අදාල ක්ෂේත්‍රය සම්බන්ධයෙන් දැනුමෙන් සහ ප්‍රවීනතාවයෙන් යුක්තවූ පුද්ගලයන් සමඟ අනෝන්‍ය ක්‍රියාකාරිත්වයෙන් යුතුව කටයුතු කිරීම 'සමූහ අධ්‍යන ප්‍රජාවන්' නම් වේ.
>
> -වෙන්ජර් ඊ., ආර්. මැක්ඩමොට්, ඩබ්ලිව්. සින්ඩර් (2002). පුහුණුවීම සඳහා ප්‍රජාව වගාකිරීම. හාවර්ඩ් ව්‍යාපාරික මුද්‍රණයකි. (p. 4)

මෙම පාඨමාලාව තුල 'සමූහ අධ්‍යන ප්‍රජාවන්' ඉහත දක්වා ඇති අර්ථදැක්වීමට අනුකූල වේ.

## ක්‍රියාමාලාව

ක්‍රියා මාලාව තුළින් එදිනෙදා ක්‍රියාකාරකම් සඳහා ප්‍රජාවට තාක්ෂණය පිළිගැනීම සහ නව තාක්ෂණික පුහුණුවීම් ලබාදීමට තාක්ෂණික භාරකරු සහය වේ. මෙම ක්‍රියාමාලාවන් සීමිත කාලසීමාවක් තුල තොරතුරු සන්නිවේදනය සහ තාක්ෂණ භූමිකාවට සහ විශේෂිත ප්‍රජා අධ්‍යන වැඩසටහන් වලට අදාලව මනාව අර්ථගන්වා ඇති අරමුණු වලින් යුක්ත වන ක්‍රියාකාරකමකි.

මෙම ක්‍රියාමාලාව මූලික ක්‍රියාකාරකම් තුනකින් සමන්විත වේ.

- ප්‍රජා සහභාගීත්වය
- තාක්ෂණික පුහුණුව සහ සීඝ්‍ර මූලාදර්ශය
- ක්‍රියාමාලාව කළමනාකාරිත්වය සහ ප්‍රතිඵල ඇගයීම

ප්‍රජාවේ අවශ්‍යතා සහ අභියෝග හඳුනාගැනීමටත්, කිසියම් ක්‍රියාමාලාවක් තෝරාගැනීමේදී ඒවා ප්‍රමුඛතා අනුව පෙළගැස්වීමට දායකවීමටත්, තාක්ෂණික භාරකරු ප්‍රජාව සමඟ ලංව කටයුතු කල යුතුය. මෙහි සාර්ථකත්වය රඳාපවතිනුයේ ප්‍රජාවේ සාමාජිකයන් විසින් අවශ්‍යතා හඳුනාගැනීමට දක්වන ප්‍රතිචාර වලට අනුකූල වන පරිදී අර්ථගන්වා ඇති අරමුණක් මඟිනි. මෙහි මඟපෙන්වන මූලධර්මය වන්නේ තාක්ෂණයට පෙර දැක්ම යන්නය.

## තොරතුරු සන්නිවේදනය තාක්ෂණ ලාබදායී ක්‍රමවේද

පහසුවෙන් සපයාගත හැකි සහ ප්‍රායෝගිකව යොදාගතහැකි අඩු මිල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ප්‍රජාව සඳහා පුහුණුවීම්වලට යොදාගත හැකිය. ප්‍රජා සාමාජිකයන් අතර දැනට ලබාගත හැකි තාක්ෂණය භාවිතා කිරීමටත් ( උදා: ජංගම දුරකථන) සහ ඒවා තුලින් නව පුහුණුවීම් සහ සේවා හඳුන්වාදීමටත් ඒමඟින් එම උපකරණවල වටිනාකම වැඩි කිරීම සඳහාත් තාක්ෂණික භාරකරු දිරිමත් කෙරේ. මෙහි මඟපෙන්වන මූලධර්මය වන්නේ ''සරල බව සහ පහසු මිල'' ය.

## සීඝ්‍ර මූලදර්ශය

තාක්ෂණික භාරකරුවන්, තොරතුරු සන්නිවේදනය හා තාක්ෂණය සමඟ නව පුහුණු කිරීම් දියත් කිරීමේදී සැමවිටම අත්හදා බැලීම් සහ දෝෂ හඳුනාගැනීමේ ක්‍රියාවලියක ප්‍රධාන භූමිකාවක් නිරූපනය කරයි. ඉතා ඉක්මනින් තාක්ෂණික දෝෂ පරීක්ෂා කිරීම සහ නිවැරදි කිරීම මඟින් ප්‍රජාවෙහි උනන්දුව නොනැසී පවත්වාගැනීමටත්, මිල අඩුකරගැනීමටත්, එම පද්ධතියේ සැලැස්ම කෙරෙහි අප්‍රමාදව ප්‍රතිචාර සපයාදීම තුලින් භාවිතාකරන්නන් සඳහා එය තවදුරටත් දියුණුකරගැනීමටත් හැකිවේ.

## ඇඟයීම

කිසියම් ක්‍රියා මාලාවක් හඳුන්වා දීමේදී, තාක්ෂණික භාරකරුවා මුළු ක්‍රියාවලියම කළමනාකරණය කිරීම සහ අවසන් ප්‍රතිඵලය ඇඟයීම සඳහා වගකියනු ලැබේ. මෙහිදී වගකීම කලාප 5 කට බෙදනු ලැබේ: (1) පෙර ක්‍රියා මාලා කලාපය ,(2) ප්‍රජාව නියැලීමේ කලාපය,(3) තාක්ෂණික මූලාදර්ශ කලාපය,(4) ක්‍රියා මාලා කලාපය,සහ (5) පසු ක්‍රියා මාලා කලාපය. ඔවුන්ගේ භූමිකාවට අමතරව තාක්ෂණික භාරකරු ක්‍රියා මාලාව කෙරෙහි බලපාන පහත සඳහන් සාධක තුන කෙරෙහි සැලකිලිමත් වියයුතුය: (1) අනුග්‍රාහකයාගේ උපකාරය; (2) ප්‍රජාවේ සූදානම;(3) තාක්ෂණයේ යෝග්‍යතාව සහ විශ්වාසනීයත්වය. ක්‍රියා මාලාව කළමනාකරණය සහ ප්‍රතිඵල ඇඟයීම සැලැස්මක් මත පදනම් වන අතර භාරකරු එය සංවර්ධනය සහ දියත්කිරීම ක්‍රියාමාලාවක් මඟින් සිදු කරයි. ක්‍රියා මාලාව අවසානයේදී ක්‍රියා මාලාවේ ප්‍රතිඵල භාරකාරයා මඟින් ප්‍රජාවේ සාමාජිකයන්ට සහ අනුග්‍රාහය දක්වන සංවිධානයට වාර්තා කරන අතර, තවද ඊළඟ ක්‍රියා මාලාවේ ද ප්‍රතිඵල දන්වනු ලැබේ.මෙහි මඟපෙන්වන මූලධර්මය වනුයේ අසාර්ථකත්වය තේරුම්ගැනීම සහ සාර්ථකත්වය ගොඩනගා ගැනීමයි.

## තාක්ෂණික භාරකාරකයෙකු වීමට සූදානම් වීම

ඇතැම් පුද්ගලයින් තාක්ෂණික භාරකාරකයෙකුගේ භූමිකාව නියැලී සිටිනුයේ කිසිඳු විශේෂිත පුහුණුවීමකින් තොරවය. එය සම්පූර්ණයෙන්ම පිළිගතහැකි අතර, අපි මෙය මීට පෙර ශ්‍රී ලංකාවේ මෙන්ම වෙනත් ස්ථානවලද දැක ඇත. කෙසේවුවත් මෙම කෙටි පාඨමාලාවේ මූලික අභිමතාර්ථය වනුයේ ඔබට තාක්ෂණික භාරකාරත්වයේ මූලික පුහුණුවීම් සහ ශිල්පීයක්‍රම සපයාදීම මඟින් ඔබ ඔබේ ප්‍රජාව තුල මෙම භූමිකාවේ යෙදීමට උපකාර කිරීමයි.

මෙම සැසිය සඳහා සහභාගී වන දේශකයින්, මෙවැනි පුහුණුවීම් ගණනාවක් විවිධ තත්ත්ව යටතේ පවත්වා ඇති අතර, මෙය ශ්‍රී ලංකාව තුල ඵලදායී උපායමාර්ගික තාක්ෂණික කළමනාකරණයක් ඇතිකිරීම සඳහා දැනට සිදුකරන පර්යේෂණ ව්‍යාපෘතියක කොටසකි. මෙම පාඨමාලාව සඳහා ඔබේ සහභාගිත්වය මඟින් අපට පාඨමාලාවේ අධ්‍යයනය පටිපාටිය සඳහා වැදගත් පාඩම් මාලාවන් ද, පුහුණුවීමට අවශ්‍ය ද්‍රව්‍ය සහ අකෘතිය ද සපයා ගත හැක. මෙම පර්යේෂණය සඳහා ඔබගේ සහභාගිත්වය අප අගය කරන අතර, ඔබට මෙම පාඨමාලාව එදිනෙදා කාර්යයන් සිදුකිරීමේදී උපකාරී වනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

**අවස්ථා අධ්‍යයනය: අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව-උතුර**

පහත අවස්ථා අධ්‍යයනය, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්දව 2014 වසරේදී පවත්වන ලද සත්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් මත පදනම්ව ඇත. මෙම අවස්ථා අධ්‍යයනයට අදාල විස්තර තාක්ෂණික කළමනාකරණ පුහුණුවීම් පාඨමාලාවේ පළමු අදියර සඳහා ඔබට මෙම වටිනා නායකත්ව භූමිකාවේ මුලධර්ම සහ පුහුණුවීම් හඳුන්වාදීම සඳහා යොදාගැනේ.




අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික භාරකරුවන් සඳහා වයඹ විශ්ව විද්‍යාලය තුල කරනු ලබන පුහුණුවීම් සැසියක්

# A කොටස

**සමූහ අධ්‍යාන ප්‍රජාව**

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - උතුර පළාත මැල්සිරිපුර ප්‍රාදේශීය ලේකම් කොට්ටාශයේ ධබහැර, මඩහපොළ, ඕමාරගොල්ල,පන්ලියද්ද යන ග්‍රාම නිලධාරී කොට්ටාශ ආවරණය කරයි. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව උතුර තුල ගොවීන් 300 ක් පමණ ලියාපදිංචි වී ඇත.ඉඟුරු,ගම්මිරිස්,සහ කුරුඳු වගාකරන ගොවීන්ගෙන් මෙම ප්‍රජාව සමන්විත වේ.




1 රූපය: කුරුණෑගල දිස්ත්‍රික්කය තුල උතුර-අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රජා ස්ථාන

මැල්සිරිපුර කොට්ටාශය තුල දැකිය හැකි කෘෂිකාර්මික සහ පාරිසරික ආශ්‍රිත ගැටලු සමහරක් පහත පරිදි වේ.

- ජල හිඟය සඳහා තුඩුදෙන සීමාසහිත වූ වර්ෂාව
- ඉඟුරු වගාව සඳහා ඇති භූමි ප්‍රමාණය සීමාසහිතවීම. තමන්ට අයත් වී වගාකරන භූමි තුල ඉඟුරු වගාව සඳහා ගොවීන්ගේ කැමැත්තක් තිබුනද, ශ්‍රී ලංකාවේ නීතිය යටතේ වී වගාකරන භූමි වෙනත් අරමුණු සඳහා යොදාගැනීමේ තහනම් බැවින් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට මෙම ගොවීන් සඳහා සහනාධාර ලබාදීමට නොහැකිවීම;
- පසු ගිය අවුරුදු තුල ඉඟුරු වගාව ස්වයංපෝෂිත මට්ටම දක්වා ලඟා වී ඇති බැවින් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ඉඟුරු වගාව සඳහා ඇති ප්‍රවර්ධන ක්‍රියාකාරකම් නවතා දැමීම (උදා. සහනාධාර පටිපාටිය);
- ඉඟුරු ආනයනය සඳහා රජය ගෙන ඇති තීරණය නිසා ඉඟුරු වගාව සඳහා ඇති වෙළඳපොල අවස්ථා අඩුවීම, එහි ප්‍රතිඵලයක් ලෙස ඉඟුරු වගාව තුලින් ගොවීන් හට අඩු මුදලක් ලැබීම;

තවද මෙම දිස්ත්‍රික්කයට ආර්ථික හා සමාජීය අභියෝග රැසකට මුහුණ දීමට සිදුව ඇත.ඒවා නම්
- අඩු යටිතල පහසුකම් – අඩු මහාමාර්ග පහසුකම්;
- අස්වැන්න වෙළඳපොළට ගෙනයෑමේදී ගොවීන්ට ගමනාගමන ගැටලුමෙන්ම ගමනාගමනය සඳහා අධික මිලක් දැරීමට සිදුවීම;
- සීමාසහිත වූ ඉන්ධන හා ගමනාගමන දීමනාව මත අපනයන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට මෙම ප්‍රදේශයේ සමහරක් ස්ථානවලට ලඟා වීමට නොහැකිවීම;
- අඩු වෙළඳපොළ අවස්ථා;
- ජංගම සේවා සඳහා අඩු ප්‍රවේශවීම්;

- මත්ද්‍රව්‍ය භාවිතය;
- නව යොවුන් අවධියේම බොහෝ පිරිස් විවාහ ජීවිතයට ඇතුලත් වීම; එම නිසා අඩු වයසේදී ගබ්ගැනීමේ සංඛ්‍යාව ඉහළවීම;
- වකුගඩු රෝගය (මෙම තත්වය උතුරු මැද පළාත තුල බරපතල සෞඛ්‍යමය තත්වයක් වීම);
- පානීය ජල ගැටලුව;

භූගෝල පිහිටීම මත මෙම ප්‍රදේශය තනි ප්‍රජාවක් ලෙස අර්ථදැක්විය හැකි නමුත්, එය ප්‍රජාවන් කිහිපයක් ලෙසද වෙන්කොට දැක්විය හැක. මෙම ප්‍රදේශය තුල සිටින ගොවීන් අංශ කිහිපයක් ඔස්සේ ජීවනෝපාය සඳහා සන්නිවේදනයට අදාලව රුචිකම් සහ වගකීම් හුවමාරු කරගනී. මේ අනුව, වගා කරන භෝග වර්ගයට අදාලව ප්‍රජාවන් වෙන් කර හඳුනා ගත හැකියි.

උදාහරණයක් ලෙස මැල්සිරිපුර දිස්ත්‍රික්කය තුල සිටින සියලුම ඉඟුරු වගාකරුවන් ප්‍රජාව සඳහා පුහුණුවක් පිහිටුවාගැනීමක් හෝ පොදු කාරණයක් සම්බන්ධයෙන් ( උදා., ජල කළමනාකරණය හෝ වෙළඳපොළට ප්‍රවේශවීම) දඹහැර සහ මඩහපොල සිටින විවිධ වර්ගයේ ගොවීන් එක්වීම ද සැලකිය හැකියි. ගොවියෙකුට එකම අවස්ථාවේදී සමූහ අධ්‍යාන ප්‍රජා කිහිපයක සාමාජිකයෙකු වීමට ද හැකියාව ඇත. මෙහිදී කණ්ඩායම් ක්‍රියාකාරීත්වය අත්‍යාවශ්‍ය වන අතර, රුචිකම් සහ පුහුණු තොරතුරු හුවමාරු කරගැනීම මගින් ජීවනෝපාය සඳහා සන්නිවේදනයද තිරසාර කරයි.

*වැඩ පත්‍රිකාව* ***1.1(a)***

# B කොටස

**ජීවනෝපාය සඳහා සන්නිවේදනයට ඇති අභියෝග**

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වයඹ විශ්ව විද්‍යාලය සමඟ එක්ව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ -උතුර ව්‍යාප්ති නිලධාරීන් සහ ප්‍රතිලාබ හිමි ගොවීන් අතර ජීවනෝපාය සඳහා සන්නිවේදනයට ඇති කාලය සහ වාර ගණන වැඩිකරගැනීමේ ප්‍රමුඛ අවශ්‍යතා හඳුනාගැනීමට 2013 වසරේදී ප්‍රජා රැස්වීමක් පවත්වන ලදී. සන්නිවේදන තාක්ෂණය ගොවි රැස්වීම්, සහනාධාර පටිපාටිය, රෝපණ ද්‍රව්‍ය බෙදාහැරීම, පොහොර නිර්දේශකිරීම්, සහ මිල ගණන් දැනුම්දීම යන සාමාන්‍ය පණිවිඩ හුවමාරුව තව දුරටත් දියුණුකරගැනීම සඳහා උපකාරී කරගත හැකි බවට එම රැස්වීමේදී යෝජනා විය. දැනට ප්‍රජාවට සහ ව්‍යාප්ති නිලධාරීන්ට ඇති එක් අභියෝගයක් නම් යාවත්කාලීන වන තොරතුරු තැපැල් මඟින් හෝ පෞද්ගලිකව පැමිණ ප්‍රජාවට ලබාදීම සඳහා මිලක් මෙන්ම වැඩි කාලයක් වැයවීමයි. ඵලදායි මිලක් සහිත ක්‍රමයක් යොදාගැනීම මඟින් කෙටි පණිවුඩ හුවමාරුකරගැනීම තුලින් යම්තාක් දුරට මිල සහ කාලය අඩුකරගත හැකිය.



2 රූපය: කුරුණෑගල දිස්ත්‍රික්කයේ , මඩහපොල දී අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විසින් පවත්වන ලද ප්‍රජා රැස්වීමක්

## C කොටස

### ප්‍රජාව තුල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

කුරුණෑගල දිස්ත්‍රික්කය තුල ඉඟුරු වගාකරන ගොවීන්ගෙන් 90 % වඩා වැඩි ප්‍රතිශතයක් , සාමාන්‍යයෙන් එදිනෙදා ජීවිතයේදී තොරතුරු හුවමාරු කරගැනීම සඳහා ජංගම දුරකථනය භාවිතා කරයි. විවිධ වූ අධ්‍යාපන මට්ටම් මෙම හැසිරීම සඳහා බලපෑමක් නොපෙන්වන අතර, වෙනත් අයුරකින් කිවහොත් ජංගම දුරකථන භාවිතය සඳහා අධ්‍යාපන මට්ටම බාධාවක් නොවේ. එම නිසා පහසුවෙන් යොදාගත හැකි ජංගම දුරකථනය සහ එහි ඇති පහසුකම් (උදා: කෙටි පණිවුඩ පහසුකම) ගොවීන් සමඟ සන්නිවේදනය කිරීම සඳහා වඩාත් ඵලදායි ලෙස භාවිතා කළ හැකිය.

වැඩ පත්‍රිකාව **1.1(b)**

## D කොටස

### ප්‍රජාව හැඩගැස්වීම සහ ක්‍රියා මාලාවේ අරමුණ

ප්‍රජා රැස්වීමේදී ව්‍යාප්ති නිලධාරීන් සහ ප්‍රජාවේ සාමාජිකයන්ගේ මූලික අවශ්‍යතාවයක් ලෙස රැස්වීම් වේලාවන් දැනුම් දීම සහ අනිකුත් රැස්වීම් වලට අදාලව ප්‍රජාව දැනුවත් කිරීම හඳුනා ගන්න ලදී. ප්‍රජා රැස්වීම අතරතුර ඊට පසු පැනනැගුණ අවශ්‍යතාවයන්වුයේ රෝග පලිබෝධ පාලනය, සහ වගාවට අදාල ශිල්පීය ක්‍රම යනාදියට අදාළ තොරතුරු ඉක්මනින් සහ කාර්යක්ෂමව ලබා ගැනීම සඳහා ව්‍යාප්ති නිලධාරීන් සම්බන්ධ කරගැනීමයි. ප්‍රජාව විසින් මෙබඳු ප්‍රශ්න ඉදිරිපත් කරන ඇතැම් අවස්ථාවල දී තනි තනි වශයෙන් පිළිතුරු දීමට වඩා මුළු ප්‍රජාවටම එක් පිළිතුරකින් පිළිතුරු සැපයීම වඩාත් ප්‍රයෝජනවත් වන බව ව්‍යාප්ති නිලධාරීන් විසින් පෙන්වා දෙන ලදී. තවද ප්‍රජාව විසින් ලැබෙන පණිවුඩ විමසීම් පදනම් කොටගෙන නිතිපතා අසන ගැටලු අන්තර්ගත කිරීම තුලින් දත්ත සංචිතයක් නිර්මාණය කිරීමේ හැකියාව පිලිබඳව ව්‍යාප්ති නිලධාරීන් විසින් අවධානය යොමුකරන ලදී.

මෙම ක්‍රියාදාමයේ ඊළඟ පියවර වන්නේ හඳුනාගත් ප්‍රමුඛතාවය පදනම් කරගෙන ක්‍රියා මාලාවේ පැහැදිලි අරමුණ ගොඩනැගීම සඳහා භාරකාරයා ප්‍රජාවේ සාමාජිකයන් සමඟ එක්ව කටයුතු කිරීමයි.මෙම අවස්ථාවේදී අරමුණු වචනයෙන් දක්වන්නේ මෙසේය: අපට මැල්සිරිපුර ප්‍රාදේශීය ලේකම් කොට්ටාශයේ තුල සිටින ගොවීන්ට රැස්වීම් පෙළගැස්වීමේදී සහ භෝග පාලනය ආශ්‍රිත ගැටලුවලට ප්‍රතිචාර දැක්වීමේදී ව්‍යාප්ති නිලධාරීන් සහ ප්‍රජාවේ සාමාජිකයන් අතර පණිවුඩ හුවමාරුව සඳහා ගතවන කාලය සහ මිල අඩු කරගත හැකි ක්‍රමයක අවශ්‍යතාවය සොයා ගත යුතුය.

හොඳින් අර්ථගන්වා ඇති ක්‍රියාදාමයක අරමුණ තුල පහත විස්තර අඩංගුවේ:

- විශේෂිත ඉලක්ක වලින් සමන්විතය (ගතවන කාලය සහ වියදම අඩුවීම);
- විශේෂිත ක්‍රියාකාරකමක් සඳහා (රැස්වීම් පෙළගැස්වීමට සහ ගැටලු වලට ප්‍රතිචාර දැක්වීමට අදාල පණිවිඩ හුවමාරු කිරීම);
- පැහැදිලිව අර්ථගන්වා ඇති ප්‍රජාවක් සඳහා පුහුණුවීමක් (මැල්සිරිපුර ප්‍රාදේශීය ලේකම් කොට්ටාශය තුල සිටින ඉඟුරු, ගම්මිරිස්, කුරුඳු ගොවීන්);

වැඩ පත්‍රිකාව***1.2***

# E කොටස

## ප්‍රාථමික සන්නිවේදන ක්‍රමය සහ සීඝ්‍ර මුලාදර්ශය

භාරකාරයා සහ ප්‍රජාව ප්‍රමුඛතා සහ ක්‍රියාමාලාවේ පෙළගැස්ම හඳුනාගත් පසු, ඊළඟ පියවර වන්නේ ක්‍රියාමාලාවේ අරමුණු ඉටුකරගැනීමට උපකාරී වන අයුරින් තාක්ෂණික විසඳුමක් ලබාගැනීමයි. (දේශීය භෝගවල මිල ගණන් පිළිබඳ තොරතුරු හුවමාරු කිරීම, රෝග පාලනය සඳහා උපදෙස් ලබාගැනීම,සාමාන්‍ය ගැටලු, නිවේදන වැනි දේ).

භාරකාරයා සහ ප්‍රජාව ක්‍රියාමාලාවේ සැලසුම සැලසුම්කිරීමට, ව්‍යාප්ති නිලධාරීන් සහ ප්‍රජාවේ සාමාජිකයන් අතර ජීවනෝපාය සඳහා සන්නිවේදනය කෙටි කාලයක් තුලදී සහ අඩු වියදමකින් සිදුකිරීමට ගත් උත්සාහයක් ලෙස ඒ සඳහා කෙටි පණිවුඩ යොදාගැනීමට තීරණය කරන ලදී. වයඹ විශ්ව විද්‍යාලය, ඕනෑම කෙනෙකුට අඩු වියදමකින් ප්‍රවේශවිය හැකි ෆ්‍රෝන්ට්ලයින් එස්.එම්.එස් නමින් හඳුන්වන කෙටි පණිවුඩ ක්‍රමයක් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට සහ තාක්ෂණික භාරකරුට සපයන ලදී. තාක්ෂණික භාරකරුගේ ඊළඟ පියවරවූයේ වයඹ විශ්ව විද්‍යාලයේ උපාධිධාරී සිසුවෙකු සමඟ එක්ව ෆ්‍රෝන්ට්ලයින් එස්.එම්.එස් වල සීඝ්‍ර මුලාදර්ශය යන ක්‍රියාවලිය භාවිතයෙන් කෙටි පණිවුඩ සේවාව දියත් කිරීමයි( 4 රූපය).




4 රූපය: වයඹ විශ්ව විද්‍යාලය සහ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඩහපොල දී කරනු ලබන සීඝ්‍ර මූලාදර්ශය පිලිබඳ අභ්‍යාසයක්

ක්‍රියාමාලාව සැලසුම්කරණවිටදී, තාක්ෂණික භාරකරු විසින් ප්‍රජාවේ හැඩගැසීමට සහ ක්‍රියාමාලාවේ අරමුණ සම්බන්ධයෙන් ඇති ප්‍රාථමික සන්නිවේදන ක්‍රමය හඳුනාගැනීම අවශ්‍ය වේ. මෙම අවස්ථාවේදී ක්‍රියාමාලාවේ අරමුණවූයේ ව්‍යාප්ති නිලධාරීන් සහ ප්‍රජා සාමාජිකයන් අතර පණිවුඩ හුවමාරුව කෙටි කාලයකින් සහ අඩු වියදමකින් සිදුකිරීමටයි.

ක්‍රියා මාලාවක් සංකීර්ණ තොරතුරු හුවමාරුවකට සම්බන්ධ විය හැකි නමුත් පහත සඳහන් මූලික අන්තර්ක්‍රියා හතර සැලකීම, සැලසුම්කරණ ක්‍රියාවලිය සරල කිරීම සඳහා උපකාරී වේ:

1. ක්‍රියා මාලාව සංවාද සහ ක්‍රියාකාරකම් සඳහා සහභාගී වීමට උපකාරී වේ;
2. ක්‍රියා මාලාව මෙවලම් නිර්මාණයට, තැන්පත්කිරීමට,හුවමරුකිරීමට උපකාරී වේ;
3. ක්‍රියා මාලාව නියම වෙලාවට(හෝ නියම වෙලාවට ආසන්නව) සන්නිවෙදනයට උපකාරී වේ;
4. ක්‍රියා මාලාව asynchronous (post & wait) සන්නිවේදනයට උපකාරී වේ;

මෙම වර්ගීකරණ ක්‍රියාවලිය අපට පහත සටහනින් නිරූපණය කළ හැකිය.(5 වන රූපය):




5 රූපය: සන්නිවේදන ක්‍රම වර්ගීකරණය

ප්‍රාථමික සන්නිවේදන ක්‍රමය හඳුනාගැනීම, තාක්ෂණික භාරකරුට අවශ්‍යතාවලට ඇහුම්කන්දීමෙන් සහ ක්‍රියාදාමයේ අවශ්‍යතා මුදුන්පමුණුවා ගැනීම සඳහා පද්ධතිය දියත්කිරීමට අවශ්‍ය ක්‍රියාවලීන් තුලින් සුදුසු ක්‍රමයක් ලබාගැනීමට උපකාරී වේ. තවද පළමු ක්‍රියාදාමය ආරම්භ කරන විට එක් ප්‍රාථමික සන්නිවේදන ක්‍රමයක් පදනම් කරගත් අරමුණක් වටා සැලසුම් කිරීම ප්‍රයෝජනවත් විය. (ක්‍රියාමාලාව සඳහා එක් සන්නිවේදන ක්‍රමයකට වඩා සම්බන්ධ කරගැනීමෙන් සැලසුම්කිරීම සංකීර්ණ වන අතර ඇගයීම අපහසු වේ).

මෙම අවස්ථාවේදී උතුර-අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සලකන විට, ඉහත සටහනේ 1 වන කොටුව තුල ප්‍රාථමික ක්‍රමය පෙන්නුම් කරයි: ව්‍යාප්ති නිලධාරියා සහ ප්‍රජාවේ සාමාජිකයන් අතර සංවාදයට උපකාරයක් වශයෙන් පණිවුඩ යැවීම අදහස් කරන නමුත් ඒ සඳහා ක්ෂණික ප්‍රතිචාර හෝ දැන්වීමක් අවශ්‍ය නොවීය.

ඒ අනුව, අනුමානකළහැක්කේ ප්‍රජාවේ සාමාජිකයින්ට ව්‍යාප්ති නිලධාරියාට කෙටි පණිවුඩ යැවීමට සහ ව්‍යාප්ති නිලධාරියාගෙන් කෙටි පණිවුඩ ලැබීමට පහසු ක්‍රමයක් අවශ්‍ය බවය.ව්‍යාප්ති නිලධාරියාට ද ප්‍රජාවේ සාමාජිකයන්ගේ දුරකථන අංක ලබාගැනීමට පහසු ක්‍රමයක් අවශ්‍ය වන අතර එමඟින් ඔවුන්ගේ කැමැත්ත පරිදී විශේෂිත ප්‍රජා පුහුණුවීම්වලට අදාල පණිවුඩ යැවිය හැකිය ( ඉඟුරු වගාව). තවද අපට අනුමාන කළ හැක්කේ අන්තර්ගත දත්ත ගබඩා කිරීමට හෝ ආරක්ෂා කිරීමට අවශ්‍ය පහසුකම් ඉක්මනින් දියත්කිරීමේ අවශ්‍යතාවයක් මෙම ප්‍රජාවට නොමැති බවයි

මෙම තර්කය අනුගමනය කිරීමේදී පහත සඳහන් මූලික අවශ්‍යතාවයන් සන්නිවේදන ක්‍රමය හා ෆ්රෝන්ට්ලයින් එස්.එම්.එස් ක්‍රමයට අනුව හඳුනාගන්නා ලදී:

- ව්‍යාප්ති නිලධාරියා සමඟ පණිවුඩ හුවමාරුවට කැමැත්තක් දක්වන ප්‍රජා සාමාජිකයන්ගේ දුරකථන අංක ඇතුලත් දත්ත සංචිතයක් තාක්ෂණික භාරකරු විසින් නිර්මාණය කිරීම අවශ්‍යවේ;
- දත්ත සංචිතය තුල ඉඟුරු වගාකිරීමට සම්බන්ධ පණිවුඩ ලබාගැනීමට විශේෂිත කැමැත්තක් දක්වන ගොවීන් සඳහා උප කණ්ඩායමක් අන්තර්ගත විය යුතුය;

ෆ්රෝන්ට්ලයින් එස්.එම්.එස් සහිත ජංගම දුරකථන අංක දත්ත සංචියක් නිර්මාණය කිරීම ක්‍රම කිහිපයකින් සිදුකළහැකිය. කෙසේ වෙතත් ව්‍යාප්ති නිලධාරියාගේ කාලය සහ පරිශ්‍රමය ඉතුරු කරගැනීම සඳහා තවත් අමතර අවශ්‍යතාවයන් දෙකක් මෙම පද්ධතිය සමඟ දියත්කිරීමට තීරණය කර ඇත:

- ව්‍යාප්ති නිලධාරියා විසින් ප්‍රජා සාමාජිකයන් හට රැස්වීම් සහ වෙනත් පුවත් සම්බන්ධ පණිවුඩ ස්වයංව ලබාගනුවෙකු ( ලබා නොගනුවෙකු) වීමේ හැකියාව තිබිය යුතුය;
- ඉඟුරු වගාව සම්බන්ධ විශේෂිත මාතෘකා යටතේ පණිවුඩ ව්‍යාප්ති නිලධාරියාගෙන් ලබාගැනීමට උප කණ්ඩායමක ස්වයංව ලබාගනුවෙකු ( ලබා නොගනුවෙකු) වීමේ හැකියාව තිබිය යුතුය;

භාරකාරයා විසින් ෆ්රෝන්ට්ලයින් එස්.එම්.එස් ස්ථාපනය කොට මෙම විශේෂිත අවශ්‍යතාවයන් ක්‍රමය මත මූලපද විශ්ලේෂාංගයක් භාවිතයෙන් මූලාදර්ශයක් සංවර්ධනය කරන ලදී.පද්ධතිය අදහස් කරන පරිදී වැඩ කරන බවට සනාථ කරගැනීම සඳහා කෙටි පර්යේෂණ මාලාවක් ප්‍රජා සාමාජිකයන් කිහිපදෙනෙක් සමඟ පවත්වන ලදී. ඉන්පසු එය ක්‍රියාමාලාව සඳහා සූදානම් කරන ලදී. ක්‍රියා මාලාව සැලසුම්කිරීමේ කොටසක් ලෙස මෙම අවස්ථාවේදී ප්‍රජා රැස්වීම් අතරතුර සීඝ්‍රයෙන් මූලාදර්ශ ඇතිකිරීම සම්පූර්ණ කිරීමට හැකිය.

**1.3 වැඩ පත්‍රිකාවට යන්න**

## F කොටස

### උපායමාර්ගිකව ක්‍රියාමාලාව සැලසුම්කිරීම

භාරකරු විසින් සීඝ්‍ර මූලාදර්ශ පරාසය අනුගමනය කරමින් කෙටි පණිවුඩ පද්ධතියක් ප්‍රජාව සමඟ භාවිතාකිරීමේ ක්‍රියාමාලාවක් හඳුන්වාදීමට සැලසුම් කිරීම ආරම්භ කරන ලදී.

ක්‍රියාමාලාවක් යනු ප්‍රජාව, භාරකරු සහ අනුග්‍රාහකයා විසින් හඳුනාගන්නා ලද විශේෂිත අරමුණක් කෙටි කලකදී ආමන්ත්‍රණය කළහැකි මැදිහත්වීමකි.මෙම ක්‍රියාමාලාව මඟින් කාලය සහ සම්පත් දීර්ඝ කාලීන කැපවීමකින් තොරව සුදුසු විසඳුම් පරීක්ෂාකිරීම සහ ඇඟයීම සඳහා පරීක්ෂාවක් ලබාදේ. ආරම්භක ක්‍රියාමාලාව සඳහා වේගවත්භාවය සහ සරලභාවය විශේෂයෙන් වැදගත් වේ. අඩු වියදම සහ ක්‍රියාමලාවේ බලාපොරොත්තු කළමනාකරණය කිරීම සඳහා මෙය විශේෂයෙන්ම වැදගත් වන බැවිනි. මෙම තාක්ෂණය හඳුන්වාදීම මඟින් ප්‍රජාව එහි අරමුණු මුදුන්පත් කළ අයුරු වඩා හොඳින් තේරුම් ගැනීම සඳහා තාක්ෂණික භාරකරුට සම්මුඛ පරීක්ෂණ, සමීක්ෂණ සහ මෘදුකාන්ග වාර්තා මඟින් පද්ධතියේ භාවිතය ලබාගැනීම තුලින් ප්‍රතිචාර එකතු කරගැනීමේ අවස්ථාවද මෙම ක්‍රියාමාලාව තුලින් ලබාදී ඇත.

ක්‍රියාමාලාවක් විචල්‍ය හතරකින් සමන්විත වේ: (1) අනුග්‍රාහකයා, (2) තාක්ෂණික භාරකරු, (3) ප්‍රජාව සහ (4) තාක්ෂණය (1 වගුව).

1 වගුව: ක්‍රියා මාලාවේ සාරාංශය

| අනුග්‍රාහකයා / සංවිධානයේ කොටස්කරුවන් | තාක්ෂණික භාරකරුවන් | ප්‍රජාව | තාක්ෂණය |
|---|---|---|---|
| අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | (චන්දන, හේරත්) | මැල්සිරිපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල ඉඟුරු, ගම්මිරිස් සහ කුරුඳු වගා කරන කණ්ඩායම් | ෆ්රෝන්ට්ලයින් එස්.එම්.එස් |

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මෙම අවස්ථාවේදී, වැඩි ප්‍රජා සාමාජිකයන් සංඛ්‍යාවකට කෙටි පණිවුඩ යැවීමේ හැකියාව සහිත ජංගම දුරකථනවලට ප්‍රවේශ විය හැකි බැවින් සහ මෙය වටිනා උත්සාහයක් බවට බොහෝ දෙනෙකුගේ මතය වූ බැවින් මෙම ක්‍රියාමාලාව කෙටි පණිවුඩ පද්ධතිය පදනම්කිරීමට තීරණය කරන ලදී. තනි පුද්ගල දුරකථන ඇමතුම් සමඟ සංසන්දනය කිරීමේදී සාපේක්ෂව විශාල ප්‍රතිග්‍රාහකයන් පිරිසක් සඳහා අඩු වියදමකින් හා ඉක්මනින් කෙටි පණිවුඩ යැවිය හැකිය. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ වයඹ විශ්ව විද්‍යාලය පුහුණුවීම් සැපයීම මගින් හා ෆ්රෝන්ට්ලයින් එස්.එම්.එස් සඳහා ප්‍රවේශවීමට සහ විකාශන වෙලාවේ ආධාරය මගින් සීමිත කාලසීමාවක් තුල ඇති පණිවුඩ යැවීමේ ක්‍රියා මාලාව සඳහා භාරකරුට උපකාරී වේ.

සීඝ්‍ර මූලාදර්ශය සම්පූර්ණ කිරීමෙන් පසුව, පණිවුඩ යැවීමේ පද්ධතිය මගින් ප්‍රජාව සඳහා ක්ෂණික වටිනාකමක් ඇති බව බලාපොරොත්තු වූවාත් සමගම ඉඟුරු භෝග වගාවත් සමගම දියත් කළ යුතු ක්‍රියාමාලාව සැලසුම් කරනු ලැබේ.

පෝස්ටර් නිපදවීම හා ප්‍රජාව තුල බෙදාහැරීම මගින් ක්‍රියාමලාව ප්‍රචලිත කිරීම සහ පණිවුඩ යැවීමේ කණ්ඩායම සමඟ එක් වන ආකාරය පිළිබඳ තොරතුරු ලබාදේ (6 රූපය). මෙම පෝස්ටර් ක්‍රියාමාලාව විස්තර කරන අතර ෆ්රෝන්ට්ලයින් එස්.එම්.එස්. වලට මූලපද විශේෂාංගයක් යැවීම මගින් ගොවීන්ට පණිවුඩ පද්ධතියේ ස්වයං ලබාගනුවෙකු වන ආකාරය පැහැදිලි කරයි.




6 රූපය: උතුර අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ක්‍රියා මාලාව ප්‍රචලිත කිරීම සඳහා සාදන ලද පෝස්ටරයක්

මෙම ක්‍රියා මාලාව සති 16ක් සඳහා සැලසුම් කෙරේ.මෙම ක්‍රියාමාලාව දියත් කිරීම සඳහා තාක්ෂණික භාරකරු විසින් ප්‍රජා රැස්වීමක් පවත්වන අතර එම රැස්වීම් මගින් ක්‍රියාමාලාව පවත්වන කාලසීමාව තුල ප්‍රජා සාමාජිකයන්ට එය පිලිබඳ පැහැදිලි කිරීම සහ ප්‍රචලිත කිරීම සිදුකෙරේ.භාරකරුට මෙම රැස්වීම් තුලින් ප්‍රජා සාමාජිකයන්ට මෙම ක්‍රියාමාලාව පිලිබඳ ඇති අපහසුතා සහ ගැටලු ඉක්මනින් හඳුනාගැනීමට සහ විසඳීම සඳහා ඇගයීම් ක්‍රමයක් ද ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇත.

භාරකරු විසින් පද්ධතිය භාවිතය ඇගයීම සඳහා ෆ්රොන්ට්ලයින් එස්.එම්.එස් මෘදුකාංගයට එකතුවන දත්ත පිළිබඳ ක්‍රමානුකූලව පරීක්ෂණ පවත්වනු ලැබේ. මෙම ක්‍රියාමාලාව අවසානයේදී භාරකරු ප්‍රජාව හමුවී ප්‍රතිඵල සාකච්ජා කිරීම, ක්‍රියාමලාවේ ප්‍රබලතා හා දුබලතා හඳුනාගැනීම, සහ අවසන් ප්‍රතිඵල ඇගයීමක් ද සිදුකරයි.

මෙම භාරකරු දත්ත එකතු කිරීම, ප්‍රජා රැස්වීම් අතරතුර සටහන් තබාගැනීම, ප්‍රජාවට සහ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට වාර්ථාවක් ලබාදීම සහ අරමුණට අදාලව ක්‍රියාදාමය පිළිබඳ අවසන් තක්සේරුව පැවැත්වීම සඳහා වයඹ විශ්ව විද්‍යාලය සමඟ එක්ව කටයුතු කෙරේ.

## *1.4 වැඩ පත්‍රිකාවට යන්න*

### ප්‍රතිඵල සහ නිගමන

කෙටි කාලයක් තුල අඩු වියදමකින් කෙටි පණිවුඩ යොදාගනිමින් තොරතුරු හුවමාරුව වැඩි වුවද, ප්‍රජාව තුල සිටි සමහරෙක් එයට අනුගතවුයේ සෙමිනි.කොහොමනමුත්, ප්‍රජාව මෙම පද්ධතිය අඛණ්ඩව සිදුකරගෙන යාමට කැමැත්තක් දැක්වූ අතර දෙවන ක්‍රියාමාලාව දියත් කිරීම සඳහා තීරණය කොට තිබුණි. දෙවන ක්‍රියාමාලාවට ද අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය සහයෝගය ලබාදේ.

තවද ප්‍රජවට සහ භාරකරුට පළමු ක්‍රියාමලාවේ ප්‍රතිඵල මගින් අනාවරණය වුයේ ප්‍රජාවේ කෙටි පණිවුඩ භාවිතා කිරීමට නොහැකි සහ අකමැති පිරිසට හඬ පදනම් කරගත් පණිවුඩ පද්ධතියක් වඩාත් සුදුසු බවයි. ඒ අනුව දෙවන ක්‍රියා මාලාව තුල කෙටි පණිවුඩ පද්ධතියට අමතරව ඕනෑම කෙනෙකුට අඩු වියදමකින් ලබාගත හැකි අන්‍යෝන්‍ය හඬ ප්‍රතිචාර පද්ධතියක් හඳුන්වා දීම සඳහා බලාපොරොත්තුවෙන් සිටී.

කාලයත් සමඟම, ප්‍රජාව සමඟ අඛණ්ඩව වැඩ කරමින්, ඔවුන්ගේ සන්නිවේදන පුහුණුවීම්වල ස්ථිර කොටසක් වශයෙන් කෙටි පණිවුඩ ක්‍රමය සමඟ කටයුතු කිරීමට උනන්දු කිරීම භාරකරුගෙන් බලාපොරොතු වේ. ඔවුන්ට මෙම පද්ධතිය වඩාත් හුරුපුරුදු වීම මගින් හා එය භාවිතාකිරීමෙන් ලබාගන්නා විශ්වාසය තුලින්, අනුග්‍රාහකයාගේ සහ ප්‍රජාවේ උපකාර ඇතිව මෙම තාක්ෂණික භාරකරුට හඬ හෝ වචන මගින් පණිවුඩ යැවීමේ නවීනතම භාවිතයන් සහ අනෙකුත් තොරතුරු හුවමාරු කරගන්නා ක්‍රම ක්‍රියා මාලාව පදනම් කරගත් ප්‍රවේශය මගින් ප්‍රජාවඋනන්දු කිරීමේ හා උපකාරකිරීමේ භූමිකාවක්ද ඇත.

මිල අධික නොවන ජංගම දුරකථන ප්‍රජාව තුල විශාල වශයෙන් තිබෙන බැවින්, පහසුවෙන් සපයාගත හැකි තවත් බොහෝ අලුත් දේවල් තිබෙන බැවින් තවදුරටත් සන්නිවේදනය දියුණු කරගැනීම හැකියාව ඇත. කාලයත් සමඟ ක්‍රියාකාරී තාක්ෂණික භාරකරුවෙකුට විශ්වාසයෙන් හා තෝරාගැනීමෙන් යුතුව නව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ප්‍රජාවේ ජීවනෝපාය සඳහා සන්නිවේදන පුහුණුවීම් වැඩි දියුණු කිරීම සඳහා භාවිතා කිරීමට උපකාර කිරීමේ වැදගත් නායකත්ව භූමිකාවක නියැලීමට හැකියාව ඇත.